ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව - **2019**

---

# **1. මූල්‍ය ප්‍රකාශන**

## **1.1 මතය වියාචනය**

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2019දෙසැම්බර් 31 දිනටමූල්‍යතත්ත්ව ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 කොටසේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත් කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## **1.2 මතය වියාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

## **1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකිවිය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සුනාමි ව්‍යසනය හේතුවෙන් හානි වූ වත්කම් පුනරුත්තාපනය කිරීම සඳහා 2004 වර්ෂයේ වෙන්කර තිබුණු රු.945,559,937 ක ප්‍රතිපාදනයෙන් එම වත්කම් ප්‍රතිසංස්කරණය කර ප්‍රාග්ධන ලැබීම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එසේ වුවත් අදාල වත්කම්වල ක්‍රමක්ෂය ප්‍රාග්ධන ලැබීම් සමඟ ගැලපීමට කටයුතු නොකර වර්ෂ 15 කට වැඩි කාලයක් සංචිත යටතේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණි. | 2007 වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකල අතර එහිදී හානි වූ වත්කම් හැර අනිකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලදී. පසුව එදිනට තිබූ ලේජරයේ සඳහන් වත්කම් සමග ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් සමඟ ගලපා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සංචිත ගිණුමක් සකසා ඇති අතර එහි වටිනාකම රු.2,686,972,668 ක් වේ. එම නිසා ඉදිරියේ නැවත අදාළ ගැලපීම් පරීක්ෂාකර බලා ඉදිරි ගිණුම් වලදී ගැලපීමට කටයුතු කරමි. | වත්කම් වල ක්‍රමක්ෂය ප්‍රාග්ධන ලැබීම් සමඟ ගැලපීමට කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාව විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ බදු දී තිබුණු දේපල එහි සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශන වල දක්වන බව මූල්‍ය ප්‍රකාශන අනාවරණය කර තිබුණි. එසේ වුවත් මෙසේ බදු දී තිබුණු දේපල 87 කට අදාල සාධාරණ අගය ගණනය කර මූල්‍යප්‍රකාශන වල දක්වා නොතිබුණු අතර මෙකී ආයෝජිත දේපළ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර ද නොතිබුණි. | ඉදිරියේදී මෙම බදු දුන් දේපල සාධාරණ අගයන් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කරමි. | බදු දී ඇති දේපළ තක්සේරු වාර්තා ලබාගෙන, සාධාරණ අගයකට මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කල යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුරාණවැල්ල ධීවර වරායෙහි අභ්‍යන්තර මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2019 මාර්තු 07 දින ගෙවා තිබූ රු.1,788,400 ක අත්තිකාරම් මුදල කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත නොකර නඩත්තු වියදම් ගිණුමට හර කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි. | එම අත්තිකාරම් මුදලට අදාල ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති බවට ඉංජිනේරුවරයා විසින් සහතිකය ලබා දී ඇති අතර එමගින් අභ්‍යන්තර මාර්ග පද්ධතියේ කොටසක් ප්‍රතිසංස්කරණය කර ඇත. එම නිසා මෙම මුදල වියදමක් සේ සලකා ගිණුම් ගත කර ඇත. | යටිතල පහසුකම් ඉදිකිරීම් යටතේ සිදුකරන ප්‍රාග්ධන වියදම්, කෙරීගෙන යන වැඩ යටතේ හඳුනාගත යුතුය. |
| (ආ) පුරාණවැල්ල ධීවර වරායෙහි දැල් සැකසුම් ශාලාවෙහි ඉදිකිරීම් කටයුතු 2019 මැයි 16 දින අවසන්ව තිබියදී කොන්ත්‍රාත් වටිනාකම රු.6,445,061 ක් වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | 2019 ජුනි 26 වන දිනඅවසානගෙවීමත්සමගමවැඩකටයුතුනිමාකර ඇත්තේ 2019 වර්ෂයේදීය. නමුත් එම දැල් ශාලාව සම්පූර්ණයෙන් පරිහරණය කරන ලද්දේ 2020 ජනවාරි මාසයේ සිටය. ඒ අනුව 2019 වර්ෂයේ වත්කම් ගිණුමට මාරු කිරීම සඳහා ජ'නල් සටහන් මගින් ගිණුම්ගත කරනු ලබයි. | ඉදිකිරීම නිමකිරීමේ, සහතික අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ කෙරීගෙන යන වැඩ වලින් වත්කම් වලට මාරු කල යුතුය. |
| (ඇ) හලාවත සහ මිරිස්ස ධීවර වරායන් හරිත ධීවර වරායන් ලෙස සංවර්ධනය කිරීම වෙනුවෙන් පූර්ව සහ පශ්චාත් කොන්ත්‍රාත් උපදේශන සේවා සැපයීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.4,906,175 ක මුදල උපදේශන සේවා ගාස්තු වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට අමාත්‍යංශ ප්‍රදාන ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ අලාභය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි. | නිවැරදි කිරීම සඳහා ජ'නල් වවුචර් අංක **J/ 117 /2021**යටතේ ගිණුම් සටහන යොදනු ලබන අතර එය 2020 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී 2019 වර්ෂයට අදාල ලාභාඅලාභයෙන් ගලපා නිවැරදිව කිරීමට මුදල් අංශය කටයුතු කර ඇත. | සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ලැබී ඇති උපදේශන සේවා ගාස්තු වෙනත් ආදායම් ලෙස නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාරක ප්‍රාග්ධන වෙනස් වීම් යටතේ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු අයිතම වල වෙනස් වීම ලෙස රු.107,330,143 ක් දක්වා තිබුණද, මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු | 2020 වර්ෂයේ ගිණුම් සමඟ නිවැරදි කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| තොරතුරු වලට අනුව එම වෙනස් වීම රු.119,763,903 ක් වූ අතර පාරිතෝෂිත ගෙවීම් රු.10,110,436 ක් වුවත් එය රු.9,636,797 ක් ලෙස අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල පෙන්නුම් කර තිබුණි. මෙම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | | |
| (ඉ) සංවර්ධනය කිරීමෙන් පසුව සංස්ථාවට භාරදී තිබුණු සහ දැනට සංස්ථාව විසින් භාවිතා කරනු ලබන ධීවර වරායන්16 කට අයත්ඉඩම් සංස්ථාවට පවරා ගෙන ඒවායෙහි තක්සේරු අගය මූල්‍යප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි. එසේම පැරැලිය නැංගුරම්පොල රු.282,705,399 ක පිරිවැයකින්ද මයිලඩි ධීවර වරාය රු.94,504,496 ක පිරිවැයකින්ද වැඩ නිමකර පිළිවෙලින් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට භාරදී තිබුණද එම ප්‍රාග්ධන ප්‍රදාන හා වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරද නොතිබුණි. | පැරැලියනැංගුරම්පොලෙහිඉදිකිරීම්ක ටයුතුසිදුකරනලද්දේ අමාත්‍යාංශයේ ව්‍යාපෘති අංශය විසින් වන අතර එහි ගිණුම්ගතකිරීම්සඳහාව්‍යාපෘති වාර්තාව ලබා ගැනීමට කටයුතු කර ඇති අතර 2021 වර්ෂයේ ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත. මයිලඩ්ඩි ධීවර වරාය ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද්දේ අමාත්‍යාංශයේ ව්‍යාපෘති අංශය විසින් වන අතර එහි ගිණුම් ගත කිරීම් සඳහා ව්‍යාපෘති වාර්තාව ලබා ගැනීමට කටයුතු කර ඇති අතර 2021 වර්ෂයේ ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රාග්ධන ප්‍රදාන හා වත්කම් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ඊ) අනෙකුත් ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලට ගෙන තිබුණු වත්කම් වල ක්‍රමක්ෂය අගය රු.19,092,251 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. මෙම නිසා මෙකී වත්කම් වල අගය හා අනෙකුත් ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් ඉහත ප්‍රමාණ වලින් මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දැක්වුණි. එසේම , 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ප්‍රදාන යටතේ මිලට ගෙන තිබුණු මුළු පිරිවැය රු. මිලියන 128.47 ක් වූ යන්ත්‍ර උපකරණ සංස්ථාවේ ප්‍රාග්ධන ප්‍රදාන වලට අදාල ප්‍රතිපත්තිය අනුව ක්‍රමක්ෂය කර නොතිබුණි. | 2020 වර්ෂයේ ගිණුම් සමහවැඩියෙන්ගණනයකරනලදක්‍රම ක්ෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇත.<br><br>මෙම ශේෂයන් වසර කිහිපයක පෙර සිට පැවත එන ශේෂයන් වන අතර එම ප්‍රධානයන්අදාල ක්‍රමක්ෂය ගැලපීම සිදු කිරීමට සටහන් කර ගතිමි. 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | සංස්ථාවේ ප්‍රාග්ධන ප්‍රදාන වලට අදාල ප්‍රතිපත්තිය අනුව නිවැරදිව ක්‍රමක්ෂය ගැලපීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (උ) මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු මයිලඩි ධීවර වරායෙහි සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම හා ඊට අදාල උපලේඛන වල දක්වා තිබුණු වියදම අතර රු. 11,518,334 ක වෙනසක්ද සංස්ථාව සතු නාවුක යාත්‍රා වල වාර්ෂික ඉන්ධන වියදම ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණ අගය හා ඊට අදාල උපලේඛන වල දක්වා තිබුණු අගය අතර රු.4,766,571 ක වෙනසක්ද නිරීක්ෂණය විය. එසේම මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ඉන්ධන තොග වටිනාකම හා භෞතික තොග වටිනාකම අතර රු. 7,957,638 ක් වූ ඉන්ධන ලීටර් 81,111 ක වෙනසක්ද නිරීක්ෂණය විය. එසේ වුවත් මෙකී වෙනස්කම් වලට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් උපලේඛනයන්හි මයිලඩි ධීවර වරායට අදාල මුළු වියදම්හි ගිණුම් සංකේත දෝෂ සිදු වී ඇති අතර මෙහෙයුම් ලාභයට හෝ අලාභයට බලපෑමක් සිදු වී නොමැත.<br>ඉන්ධන භෞතික තොග පරීක්ෂාවන්හි දී සෑම විටම පොත් අගය සමග සුළු සුළු වෙනස්කම් පවතියි. එනම් භෞතික තොග පරීක්ෂාව ඩිප් (Dip) කූර අධාරයෙන් සිදු කරනු ලබන අතර එහි කුඩා ඒකකයන් වෙනස් වීම් හේතුවෙන් සුළු සුළු වෙනස් වීම් ඇතිවිය හැක. තවද උදෑසන කාලයේ සහ සවස් කාලයේ ඉන්ධන තොග පරීක්ෂා කිරීම් වලදී ද පොත් අගයන් සමහවෙනස්වීම් දැකිය හැක. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන වල දක්වා තිබෙන අගයන් අතර වෙනස් වීම් සොයා බලා නිවැරදි කළ යුතුය. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුළු පිරිවැය රු.6,554,375,576 ක ස්ථාවර වත්කම් වර්ග 23 ක් සඳහා ස්ථාවර වත්කම් ලේඛණ, රු.108,700,043 ක් වූ වෙළඳ ණයගැති ශේෂයන් 02 කට අදාල උපයෝගී ලියවිලි හා ශේෂ සනාථන කිරීමේ ලිපි, රු.214,635,319 ක් වූ අමාත්‍යාංශ ප්‍රදාන හා වෙනත් ප්‍රදාන හා රු.838,173,660 ක් වූ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබීම් යන ප්‍රාග්ධන ප්‍රභවයන් මඟින් ඉටුකල කාර්යයන් හා ආයෝජිත වත්කම් පිළිබඳ විස්තරද, විෂයන් 04 කට අදාල මුළු වියදම රු. මිලියන 116.8 ක් වූ ජංගම වත්කම් වලට අදාල විස්තරාත්මක උපලේඛන ද සහ පෙර වර්ෂ ගැලපීම් ලෙස දක්වා තිබුණු රු.6,768,012 ක් වූ ජර්නල් සටහන් වලට අදාල උපයෝගී ලියවිලි යනාදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම නිසා එම විෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. | ඉදිරියේදී මෙම ගිණුම්වල තොරතුරු තහවුරු කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතුකරන ලෙස උපදෙස් ලබා දී ඇත. | මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ ගිණුම් ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛණ, ණයගැති උපලේඛණ, උපයෝගී ලියවිලි ශේෂ සනාථ කිරීම් යනාදී ලිඛිත සාක්ෂි විගණනය වෙත ලබා දීමට කටයුතු කල යුතුය.2018 අංක 19 දරණ ජාතික විගණන පනත viii වන කොටස 42 වගන්තිය ප්‍රකාරව විගණනය වෙත තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 396 (ඇ) | වටිනාකම රු.3,159,737 ක් වූ බැංකු ගිණුම් 4 කට අදාල නිකුත් කළ නමුත් මාස 6 ක් ඉක්ම වූ පසුවද බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධව මෙකීරෙගුලාසිය පරිදි කටයුතු කර නොතිබුණි. | මාස 06 කටවැඩිකාලයක්ඉක්මවූචෙක්පත්වලින්ගණුදෙනුකරුවන්වෙතනිකුත්නොකරඅපසතුවපවතිනචෙක්පත්අවලංගුකලඅතරගනුදෙනුකරුවන්වෙතනිකුත්කරඇතිනමුත්බැංකුවවෙතමෙතෙක්ඉදිරිපත්කර කල්පිරුචෙක්පත්සඳහාගෙවීම්නොකරනබවතහවුරුකරගැනීමෙන්පසුඅවලංගුකරඉහතබැංකුගිණුම්වලටඅදාලනිවැරදිගැලපීම්කරමාසිකබැංකුසැසඳුම්වාර්තාපිලියෙළකරනලදී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| i)II පරිච්ඡේදයේ 13.3ඡේදය | වැඩ බැලීමේ පත්වීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද නිළධාරීන් 06දෙනෙකු 2016 වර්ෂයේ සිට දිගින් දිගටම වැඩ බැලීම් සඳහා පත්කර තිබුණි. | එක් නිලධාරිනියගේ නිත්‍ය තනතුර සහකාර ගණකාධිකාරි වන අතර 2018 නොවැම්බර් 01 දින සිට වැඩ බලන ගණකාධිකාරි තනතුර ලබා දී ඇත. නව වරායන් ඉදිරිකිරිමත් සමග අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවා ගැනීම් ද සීමා සහිතව සිදු කල යුතු බැවින් පවතින තත්වය හමුවේ නියෝජ්‍ය වරාය කළමණාකරු තනතුරෙහි වැඩ බැලීම ලබා දී ඇත.නව වරායන් ඉදිකිරිමත් සමගම වරාය කළමණාකරුවන් නොමැති වීම නිසා අනුමත බඳවා ගැනීමේ පටිපාටියට යටත්ව වරාය කළමණාකරුවන් බඳවා | නිත්‍ය තනතුරු සඳහා පත්වීම් ලබාදීමට කඩිනමින් සංස්ථාව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | ගන්නා තෙක්මෙසේ වැඩ බැලීම සිදු කරන ලදි. මේ වන විට මෙම වැඩ බැලීම නවතා ඇත.2021 අප්‍රේල් 28වනදිනසිටසාමාන්‍යාධි කාරිනිත්‍යතනතුරටපත්කිරී මසිදුකරඇත . | |
| (ඇ) අංක 01/2015 හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 වන වගන්තිය | ප්‍රවාහන දීමනා ලැබීමට හිමිකම් නොමැති MM 1-1 සහ JM 1-1 කාණ්ඩයේ නිළධාරීන් 36 දෙනෙකුට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත එකතුව රු.3,133,500 ක ප්‍රවාහන දීමනා සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. | වරාය කළමණාකරුවන් සහ නියෝජ්‍ය වරාය කළමණාකරුවන් හට රාජකාරි ගමන් සඳහා දීමනාවන්ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියන් ලබා ගෙන ඇති අතර වරායන්හි සිට අනිකුත් රාජ්‍ය ආයතන වෙත ගමන් කිරීමට සැලකිය යුතු දුර ප්‍රමාණයක්නිසා වරායන්හි ප්‍රවාහන දුෂ්කරතා සලකා බලා මෙම දීමනාවගෙවනු ලබයි. | චක්‍රලේඛයේ දැක්වෙන උපදෙස් අනුව ප්‍රවාහන දීමනා ගෙවීමට කටයුතු කල යුතුය. |
| (ඈ) අංක 05/2017 හා 2017 ඔක්තෝබර් 25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය | රාජ්‍ය සංස්ථා වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ගෙවීමේ විධිවිධානවලට පටහැනිව සංස්ථාව විසින් සේවා කාලය නොසලකාසංස්ථාවෙහි ඉංජිනේරුවන් 07 දෙනෙකුට මාසිකව රු. 15,000 ක් බැගින් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව 1,080,000 ක් වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. | ඉංජිනේරු දීමනාවට අමතරව සංස්ථාවේ විධායක නිලධාරීන් සඳහා ගෙවිය යුතු වෘත්තීය දීමනාවචක්‍රලේඛ ප්‍රකාරව මෙම නිලධාරීන් සඳහා නොගෙවන අතර ඔවුන්ට අධ්‍යක්ෂ මණ්ඩලඅනුමැතියට යටත්ව ඉංජිනේරු දීමනාව ගෙවීම් කරනු ලබයි. | චක්‍රලේඛ නියමයන්ට යටත්ව වෘත්තීය දීමනා ගෙවීමට කටයුතු කල යුතුය. |
| (ඉ) අංක පීඊඞී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛය | සංස්ථාව විසින් රේඛීය අමාත්‍යාංශය සහ වෙනත් රජයේ ආයතන වලට සංස්ථාවේ සේවකයන් 13 දෙනෙකු නිදහස් කර සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.7,579,704 ක් ගෙවා තිබුණි. | අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ( පාලන හා මානව සම්පත් ) ගේ අත්සනින් යුතුව 2020 අගෝස්තු 24දින මින් ලිඛිතව මෙම සේවකයන් තාවකාලික පදනමින් රේඛීය අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන මෙන් | චක්‍රලේඛයනියමය න්ට අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඉල්ලා සිට අතර මෙම සේවයින් සඳහා අමාත්‍යාංශය වෙතින් අදාල වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබයි. | |
| (ඊ) අංක PED 03/2018 හා2018දෙසැම්බර් 07 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2017 වර්ෂයේ අලාභ තත්වය මත සංස්ථාවේ කාර්ය මණ්ඩලය සඳහා ගෙවිය හැකි උපරිම ප්‍රසාද දීමනාව රු.3,000 ක් වුවද කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට රු.15,000 ක් වන පරිදි රු.15,768,250 ක ප්‍රසාද දීමනා විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් සහ මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව 2018 වර්ෂයේදීද 2018 ලාභ තත්වය මත ගෙවිය හැකි උපරිම මුදල රු.15,000 ක් වන නමුත් එම චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට රු.25,000 ක් වන ලෙස රු.30,950,000 ක් 2019 අප්‍රේල් මසද ගෙවීම් කර තිබීම.<br>2019 ජුනි 28 දිනැති අංක PED/A/CFHC/1/1 දරණ සංස්ථා සභාපති ඇමතූ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය පරිදි ඉහත ගෙවීම අනුමත කර නොමැති අතර ප්‍රසාද දීමනා ලෙස ගෙවා ඇති මුදල් භාණ්ඩාගාරයට බැර කිරීමට කටයුතු කරන ලෙස දක්වා තිබුණද එම මුදල් විගණිත දින වන 2020 සැප්තැම්බර් වන විටත් භාණ්ඩාගාරය වෙත බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | වැලි හා කැණීම් කටයුතුවලින් ලද ආදායම් පදනම් කරගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව දිරිකාරක දීමනාව ගෙවනලදී.<br>තල් මසුන් නැරඹීමේ ව්‍යපෘතියෙන් ලැබූ ලාභය මත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව ගෙවීම් කිරීමට අනුමැතිය ලබාදී ඇති අතර, ගෙවීමෙන් අනතුරුව 2019 අප්‍රේල් 04 දින ලිඛිතව භාණ්ඩාගාරය දැනුවත් කර ඇත. ඒ අනුව 2019 මැයි 31 වන දින අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ව්‍යාපාර අප වෙත යොමු කරන ලද ලිපියට අනුව සේවකයන් හට දිරිදීමනා ගෙවීම සම්බන්ධයෙන් කර ඇති ඉල්ලීමට භාණ්ඩාගාරයේ ලබාදිය නොහැකි බවත් , ඉදිරියේදී මෙවැනි දිරිදීමනා ලබාදීමට අපේක්ෂා කරන්නේ නම් දිරිදීමනා ගෙවීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර භාණ්ඩාගාරයේ පූරවා අනුමැතිය ලබගත යුතු බවත් අවධාරණය කර ඇත. | භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතියක් මත පමණක් කාර්යය මණ්ඩල ප්‍රසාද දීමනා ගෙවීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (උ)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| i) 1.2.1 | නිල් දියවර යාත්‍රාව සඳහා රු.7,255,600 ක වටිනාකමකට Plastic Discharge Pipe with Plumbers මිලදී ගැනීම සඳහා සාධාරණ අවස්ථාවක් නොලබන ලෙස, ලංසු දැන්වීම් වෙබ් අඩවියේ පළ කල දිනම එනම් 2019 ඔක්තෝබර් 03 දින ටෙන්ඩර්පත් විවෘත කර තිබුණි. | ප්‍රසම්පාදනය සඳහා වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය භාවිතා කර ඇත. තවද ඉහත ප්‍රසම්පාදනය හදිසි වරාය නඩත්තු කටයුත්තක් බැවින් මෙය වෙළඳපල සැසඳුම් ක්‍රමය යටතේ අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව සිදුකරන ලදී. | මිලදී ගැනීම් සිදුකිරීමේදී අනුගමනය කරන ක්‍රම වේදය අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අදාල කර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ii) 5.3.13 (අ) හා 5.4.8 (අ) | 2019 ජුනි 21 දින පෞද්ගලික ආයතනයකින් රු.1,366,200 වටිනාකමට සයුර යාත්‍රාවට දෘඩාංග අයිතම මිලදී ගැනීමේදී කාර්යයසාධන සුරක්ෂණය සැපයුම්කරුගෙන් ලබාගෙන නොතිබුණි. | කාර්යසාධන ඇපකරයක් ලබානොගැනීමට හේතුව වුයේ අදාල භාණ්ඩ මිලදීගත් පසු යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය මත පදනම්ව ගෙවීම් කටයුතු සිදුකල බැවිනි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මිලදී ගැනීමේදී කාර්යසාධන සුරක්ෂණය ලබා ගැනීමට සංස්ථාව කටයුතු කල යුතුයි. |
| (ඌ) අංක 2/2017 හා 2017 දෙසැම්බර් 21දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය | 2019 දෙසැම්බර් 31 දින වන විට වාහන 08 ක් සංස්ථාව නමට ලියාපදිංචි කර නොතිබුණි. | වාහන වල ලියාපදිංචි අයිතිය දැනට පවතිනුයේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන අතර 2018 ජුනි 21 වන දිනැති ලිපිය මගින් එවකට සිටි ලේකම්තුමිය අමතා සංස්ථාවේ සභාපතිගේ අත්සනින් යුතුව මෙම වත්කම් වල අයිතිය ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත පවරා දෙන ලෙස ලිඛිතව ඉල්ලුම් කරන ලදි. | චක්‍රලේඛය අනුව වාහන ලියාපදිංචිය සංස්ථාව නමට සිදු කිරීමට කටයුතු කල යුතුය. |
| (එ)2002 අංක 14දරණ එකතු කල අගය මත බදු පනතේ 26 වගන්තිය | බදු කාල සීමාව අවසන් වන මාසයේ අවසන් දිනට පෙර එකතු කල අගය මත බදු පියවිය යුතු වුවද සංස්ථාවේ රු.10,317,782 ක් වූ එකතු කල අගය මත බදු 2019 දෙසැම්බර් 31 දක්වා පියවා නොතිබුණි. | ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරගත් පරිදි වාරික වශයෙන් ගෙවීම් කිරීම සිදුකරනු ලබයි. | බදු පනතේ වගන්ති අනුව අදාල කාල සීමාව තුල බදු පියවීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.71,111,703 ඌනතාවයක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තයරු.10,063,863ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 81,174,566 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආයතන හා පරිපාලන හා කාර්යය මණ්ඩල පිරිවැය රු. 56,357,457කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාව විසින් මාසික බදුකුලිය තීරණය කිරීමේදී රජයේ තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා ලබා නොගෙන අම්බලන්ගොඩ ධීවර වරායෙහි පර්චස් 40 ක භූමි ප්‍රමාණයක් මාසික බදුකුලිය රු.100,000 කට අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහාද පර්චස් 04 ක භූමි ප්‍රමාණයක් මාසික බදුකුලිය රු.10,000 කට ලිහිසි තෙල් අලෙවිකිරීමේ වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහාද 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමකට බදු දී තිබුණි. | රජයේතක්සේරුවසඳහායොමුකරඇතිඅතර, අදාළතක්සේරුවාර්තාලැබීමෙන්පසු බදුකුලියයාවත්කාලීනකිරීමටකටයුතුකරනුඇත. | සංස්ථාව විසින් බදුකුලිය තීරණය කිරීමේදී රජයේ තක්සේරු වාර්තා ලබා ගෙනඒ අනුව එම තීරණ ගත යුතුය. |
| (ආ) තාක්ෂණික පිරිවිතරයඅනුව ඉන්ධන පොම්පවල ධාරිතාවය මිනිත්තුවට ලීටර් 150 ක් විය යුතු වුවද, සැපයූ ඉන්ධන පොම්පවල ධාරිතාවය මිනිත්තුවට ලීටර් 138 ක් වූ අතර ස්ථාපිත කර තිබූ ඉන්ධන පොම්ප 2019 මාර්තු 11 දින වන විට භාවිතා නොකිරීම හේතුවෙන් සැපයුම්කරුට ගෙවූ රු.3,824,200 ක් නිෂ්කාර්ය වියදමක්ද වී තිබුණි. තවද, එකඟ වූ පරිදි භාණ්ඩ නොසැපයීම හා අවශ්‍යතාවයට නොගැලපෙන ඉන්ධන පොම්ප සැපයීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි. | අදාළආයතනයවිසින්කොඩ්බේ, දික්ඕවිට, බේරුවල, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, කුඩාවැල්ල, අම්බලන්ගොඩ යන වරායන් වලපොම්ප08ක් ස්ථාපිත කර ඇත.ඒඅනුවසංස්ථාවවිසින්එමපොම්පයන්ප්‍රයෝජනයටගෙනඇතිඅතර, එමආයතනයසඳහාඅත්තිකාරම්මුදල පමණක්ගෙවාඇතිනමුදුවෙනත්කිසිදුමුදලක්එමආයතනයවෙතගෙවීමකරනොමත.ඒඅනුවඅදාළපොම්පයන් හීවටිනාකමඅත්තිකාරම්මුදලඉක්මවාඇතිබවදන්වාසිටිමි. | මිලදී ගැනීම් සිදුකිරීමේදී සැම විටම තාක්ෂණික පිරිවිතර වලට අනුකූලව වන පරිදි සංස්ථාව කටයුතු කල යුතුය. |
| (ඇ)ධීවර වරායන් 06 කට ඉන්ධන ටැංකි සපයා සවි කිරීමට පෞද්ගලික ආයතනයක් සමඟ 2017 නොවැම්බර් 08 වන දින රු.11,363,000 කට එකඟ වී තිබුණි. නියමිත කාලයට වඩා දින 506 ක් ප්‍රමාද වී තිබුණද, ඉන්ධන ටැංකි | එමසමාගමවිසින්නිසිපරිදිටැංකිවරායන්වෙතසපයාතිබුනි. එහෙත්එමටැංකිස්ථාපිතකිරීමසඳහා නියමිතකාලයටවඩාවැඩිකාලයක්ලබාදීමටසිදුවුයේටැංකිස්ථාපිතකලයුතුස්ථානයන්හිවැඩනිසිපරිදිනිමකර | ඉන්ධන ටැංකි සවි කිරීමේ ප්‍රමාද කාලය වෙනුවෙන් ප්‍රමාද ගාස්තු වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කල |

| | | |
|---|---|---|
| සවිකිරීම එකඟ වූ පරිදි නිමකර නොතිබූ අතර ප්‍රමාද කාලය වන 2018 දෙසැම්බර් 15 දින සිට විගණනය සිදුකරන දින වන 2019 මාර්තු 28 දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු.11,703,809 ක ප්‍රමාද ගාස්තුවක් වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නොතිබුබැවිනි. මේවනවිටවරායන් 05 කටැංකිස්ථාපිතකිරීමේකටයුතුනිම කරඇත. | යුතුය. |
| (ඇ) පානදුර වරායේ වැලි ඉවත්කිරීම සඳහා අනුමැතියකින් තොරව 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම් ගත වී ඇප සුරක්ෂණයක්ද ලබාගැනීමකින් තොරව රු.20,000,000 ක අත්තිකාරම් එම සමාගමට ලබා දී තිබුණි. 2015 දෙසැම්බර් 10 දිනැති අතිරේක ගිවිසුමෙහි කොන්දේසි අනුව පෞද්ගලික සමාගම විසින් කැණීම් කරන ලද වැලි විකුණා ලැබෙන මුදලින් අත්තිකාරම් මුදල හිලව් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එකී මුදල් අයකර ගෙන නොතිබුණද කිසිඳු නීතිමය ක්‍රියාමාර්ගයක් විගණිත දින දක්වා ගෙන නොතිබුණි. | රු.20,000,000 කඅත්තිකාරම්මුදලින්තව දුරටත්අයකරගත යුතුව පවතිනරු.16,894,354 මුදල නැවත අයකර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ලිපිගොනු නීතිමය දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදි. | රජයේ නීතිරීති අනුගමනය නොකර සිදුකරනු ලබන අලාභ සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන ඉදිරි පියවර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. |
| (ඉ) සංස්ථාවේ වැලි ඉවත් කිරීම සඳහා අවශ්‍ය යාත්‍රා තිබියදී වැලි කියුබ් 20581 ක් ඉවත් කිරීම සඳහා වසර 03 කට පෞද්ගලික සමාගමකට 2018 ඔක්තෝබර් 23 දින කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණද කොන්ත්‍රාත්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. එසේ ඉවත්කල යුතු සම්පූර්ණ වැලි ප්‍රමාණය වැලි කියුබ් 20581 ක් වුවද 2018 ඔක්තෝබර් 23 දින සිට 2020 අගෝස්තු දක්වා වැලි කියුබ් 3426 ක් එනම් සියයට 16 ක් පමණක් ඉවත්කර තිබූ අතර 1997 මාර්තු 06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රය අනුව ධීවර වරායට යාත්‍රා පිවිසීමට වැලි ඉවත් නොකිරීම නිසා වරාය බෙසම නඩත්තු කිරීමේ සංස්ථාවේ අරමුණද ඉටු වී නොතිබුණි. | සංස්ථාව, කොන්ත්‍රාත්කරුසමඟඅදාළගිවිසුමඅත්සන්කරතිබුඅතරඑහිපිටපතක්මේ සමඟඉදිරිපත්කරමි.<br><br>වැලිඉවත්කිරීමේකාර්යයප්‍රදානයකිරීමේලිපියප්‍රකාරවසිදුනොකලබැවින්අදාළගිවිසුම2021පෙබරවාරි 10වනදිනඅත්හිටුවනලදී. | ධීවර වරායට යාත්‍රා පිවිසීමට වැලි ඉවත් කර වරාය බෙසම නඩත්තු කිරීමේ සංස්ථාවේ අරමුණද ඉටුකිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ)2014 වර්ෂයට පෙර මුළු මෙහෙයුම් ලාභයෙන් සියයට 73 ක් ඉපැයූ මෝදර ධීවර වරාය, 2014 ඔක්තෝබර් 30 දින සිට වසර 25 ක කාලයක් සඳහා පෞද්ගලික තක්සේරුකරුවකුගේ තක්සේරු වටිනාකම පදනම් කර ගෙන රු. 125,000 ක මාසික කුලියකට පෞද්ගලික ආයතනයකට බදු දී තිබුණි. ඉන්පසු සංස්ථාව සහ කල්බදු ගැනුම්කරු අතර 2015 ජුනි 10 දින ඇති කරගත් අතිරේක ගිවිසුමෙහි කොන්දේසි අංක 03 අනුව රජයේ තක්සේරුකරුගේ මාසික බදු කුලිය වන රු.1,700,000 ක් අයකරන බවට එකඟ වී තිබුණද, එම තක්සේරු වටිනාකමට වරාය බේසම ඇතුළත් කර නොතිබුණි. මේ අනුව රජයේ තක්සේරුකරුගේ මාසික බදු කුලිය අයනොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.106,203,391 ක බදු ආදායමක් සංස්ථාවට ලැබිය යුතුව තිබුණද නොලැබූ මුදල් අයකර ගැනීම සඳහා කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි. | 2020 අගෝස්තු මස 28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී උක්ත බදු ගිවිසුම අවසන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇති අතර, එකී තීරණ පිළිබඳව 2020 සැප්තැම්බර් 09 දින නීතිපතිවරයා වෙත ලිඛිතව දැනුම් දී ඇත.<br>නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2020 සැප්තැම්බර් මස 23 වන දින සංස්ථාව වෙත එවූ ලිපියෙන් එකී ගිවිසුම අවසන් කිරීමේ ලිපිය නීති අංශ මගින් කෙටුම්පත් කර එවන ලෙස දන්වා ඇති අතර, අදාල කෙටුම්පත් සකස්කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බවද දන්වමි. | සංස්ථාවේ දේපළ බදු දීමේදී විධිමත් ගිවිසුම් ඇතිකර ගෙන රජයේ තක්සේරු වටිනාකම් අනුව බදුකුලී අයකල යුතු අතර දීර්ඝ වශයෙන් බදුකුලී ගෙවීම් පැහැර හරින විට ගිවිසුම් අවලංගු කිරීම හා නිසි ක්‍රියාමාර්ග ගැනීම සිදුකල යුතුය. |
| (උ)2019 දෙසැම්බර් 31 දිනය මුළු පෙර ගෙවීම් ශේෂය රු.36,659,355 ක් වූ අතර පිළිවෙලින් වසර 4 ත් 5 ත් අතර රු.614,653 ක්ද වසර 5 ට වැඩි රු.11,551,997 ක්ද වසර 10 ට වැඩි රු.24,492,700 ක්ද වූ අතර මේ මගින් සංස්ථාවට අයත් වත්කම් පෞද්ගලික පාර්ශවයට නීතියානුකූල නොවන ලෙස පරිහරණයට ඉඩ සලසා තිබුණද මේ පිළිබඳ වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙනනීතිමය ක්‍රියාමාර්ග මේ දක්වාගෙන නොතිබුණි. | පැරණිශේෂයන්පිළිබඳසොයාබලාඑ මශේෂයන්නිරවුල්කිරීමටඅවශ්‍යකට යුතුසිදුකිරීමසඳහාකමිටුවක්වෙත යොමුකරඇතිඅතර, එම කමිටුව අදාළ ලිපි ලේඛණ ලැබුණු පසු ගිණුම්ගත කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් තබනු ඇත. | රජයේ නීතිරීති අනුගමනය නොකර සිදුකර ඇති අලාභයන් සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන නීතිමය පියවර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. |
| (ඌ)සංස්ථාවට අයත් සයුරි යාත්‍රාව වරාය අධිකාරිය අයත් ඔලුවිල් ධීවර වරායෙහි කැණීම් කටයුතු සඳහා 2016 දෙසැම්බර් 16 දින සිට 2017 මාර්තු 09 දින තෙක් යොදවා තිබුණි. එසේ වුවත් මේ සඳහා ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර වරාය අධිකාරියෙන් සංස්ථාවට ලැබිය යුතු | වරායඅධිකාරියෙන්අදාළමුදල්අයක රගැනීමටඅවස්ථාකිහිපයකදීමලිඛිත වඉල්ලීම්කරඇත.එමෙන්මනැවතව තාවක්එමමුදලඅයකරගැනීමටඉදිරි යේදීකටයුතුකරනබවදන්වාසිටිමි. | සංස්ථාවට අයත් යාත්‍රා වෙනත් ආයතන වල සේවා සඳහා යෙදවීමේදී විධිමත් ලෙස ගිවිසුම් වලට එළඹීම කල යුතුය. |

| | | |
|---|---|---|
| රු. 24,840,000 ක මුදල මේ දක්වා අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (එ)වටිනාකම රු.5,065,075 ක් වූ ඉන්ධන ටැංකි 06 ක් සැපයීම සඳහා 2007 වර්ෂයේදී රු.2,791,215 ක අත්තිකාරම් ගෙවා තිබුණද එම ඉන්ධන ටැංකි සංස්ථාවට නොලැබීම පිළිබඳව ඊට වගකිව යුතු සැපයුම් කළමනාකරුට එරෙහිව කටයුතු නොකර එම කළමනාකරු නැවත තනතුරේ පිහිටුවා විශ්‍රාම ගන්වා තිබුණු අතර සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධව දිසා අධිකරණයේ නඩු තීන්දුවකින් රු.1,745,385 ක් ගෙවීමට එකඟ වී තිබුණද 2020 සැප්තැම්බර් 29 දින ඉන් රු. 1,500,000 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඉතිරි රු. 245,385 ක් වූ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගෙවාතිබූඅත්තිකාරම්මුදල්නැවතඅ යකරගැනීමසඳහාකොළඹ දිසා අධිකරණයේ අංක1041/DMR නඩුවක් පැවතිඅතර එම නඩුව අවසානයේ එකී ආයතනය විසින් අප සංස්ථාව වෙත ගෙවීමට තිබූ රු.1,745,385 මුදලින්රු.1,500,000 පමණ මුදලක්2020 සැප්තැම්බර් 29 වන දින ගෙවීම් කර ඇත.එමෙන්මඔවුන්ගෙන්අයකරගැ නීමටනොහැකිවරු. 245,385 ක් වූ ශේෂය කපාහැරීම සඳහා 2021 පෙබරවාරි 25 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් අධ්‍යක්ෂ මණ්ඩල වෙත යොමු කළ අතර එහිදී තීරණය වූයේ එම ගෙවීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් වගකිව යුතු බවයි. අදාළ වගකිව යුතු නිළධාරීන් මේ වන විට සේවයෙන් විශ්‍රාම ගෙන ඇති බවදන්වා සිටිමි. | ප්‍රමාණාත්මක සැපයුම් සඳහා ටෙන්ඩර් ලබාගැනීමේදී ලබා දෙන අත්තිකාරම් සඳහා ඇප සුරක්ෂණ ලබා ගත යුතුයි. |

**3.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වන වගන්තිය හා 1997 මාර්තු 06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ධීවරයන් වෙත ධීවර යාත්‍රා සඳහා අළුත්වැඩියා සහ නඩත්තු පහසුකම් සැපයීමේ අරමුණ ඉටුකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත | පනතේ වගන්ති ප්‍රකාරව අරමුණු ඉටුකර ගැනීමට සංස්ථාව කටයුතු කළ යුතුය. |
| (ආ) 2000 ජනවාරි 19 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380 චක්‍රලේඛය ලංකා ධීවර වරාය සංස්ථාවට අදාල කර ගත නොහැකි බව භාණ්ඩාගාරික නියෝජිත විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා වලදී පෙන්වා දී තිබියදීත් එකී චක්‍රලේඛ පදනම් කර ගනිමින් සංස්ථාව විසින් මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන්ද | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ උපදේශන ගාස්තු ගෙවීම සම්බන්ධව කටයුතු කිරිමේදී 2000 ජනවාරි 19 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380 පදනම් කර ගනිමින් 2020 ජුනි 24 වන දින අධ්‍යක්ෂ | සංස්ථාවට අදාළ කරගත නොහැකි චක්‍රලේඛ පදනම්ව ගෙවීම් සිදු නොකල යුතු අතර එය ගෙවීම් අනුමත කල නිළධාරීන්ට අදාළව ක්‍රියාමාර්ග ගැනීමට සහ සිදු කල ගෙවීම් නැවත අය කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| තොරව මිරිස්ස සහ හලාවත ධීවර වරායන්හි ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශන සේවා සැපයීම වෙනුවෙන් සංස්ථාවට ලැබුණු රු. 9,350,000 උපදේශන සේවා ආදායමින් සංස්ථා නිළධාරීන් 23 දෙනෙකු හට උපදේශන ගාස්තු ලෙස 2019 වර්ෂයේදී එකතුව රු. 7,031,121 ක් ගෙවා තිබුණි. තවද මෙම උපදේශන සේවා සැපයීම සංස්ථාව පිහිටුවීමේ අරමුණු වලට පටහැනි බවද නිරීක්ෂණය විය. | මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර මෙම ගෙවීම සඳහා 2020 ජූලි මසදී අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.නමුදු, මෙම චක්‍රලේඛය අප සංස්ථාවට අදාළ නොවන බව පසුව සොයාගත් බැවින්මේ සම්බන්ධ ගෙවීම්අත්හිටුවාඇත. | |
| (ඇ)2014 පෙබරවාරි 18 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පොදුකාරක සභාවේ නියෝග අංක 09 අනුව වරායන් ලාභ ලබන තත්වයට පත් කිරීමට උපදෙස් දී තිබුණද 2019 වර්ෂයේ වරායන් 21 න් වරායන් 16 ක සමාලෝචිත වර්ෂය තුල සිදු වූ පාඩුව 221,140,993 ක් වී තිබුණි. | සියලුමවරායන්හාසංස්ථා වේඉහලකළමනාකාරිත්ව යෙන්සමන්විතකමිටුවක්ප ත්කළඅතර, අදාලවරායකළමනාකරුව න්ගෙන්තමවරායන්ලාභදා යිවරායන්බවටපත්කිරීමට ගතහැකියෝජනාවලින්සම න්විතව්‍යාපෘතිවාර්තාලබා ගෙනක්‍රියාත්මකකිරීමටක ටයුතුකරනලදී. එහෙත් 2016 වර්ෂයේසිට 2020 වර්ෂයදක්වාඅඛණ්ඩවසේව කවැටුප්වැඩිවීමහේතුවෙන් බොහොමයක්වරායන්පාඩු ලබනවරායන්බවටපත්විය. | දීර්ඝ කාලීන පාඩු ලබන වරායන් ලාභදායී තත්ත්වයට පත්කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ගික තීරණ ගත යුතුය. |
| (ඇ) ණයට ඉන්ධන සැපයීම නවතා දැමීමට කමිටු තීරණයක් ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ ණය පදනම මත රු.22,868,579 ක ඉන්ධන සපයා තිබූ අතර මෝදර ධීවර වරායේ රු. 5,675,373 ක නැංගුරම් ගාස්තුද හිඟ හිට තිබුණි. | ධීවරයන්හටඉන්ධනණයට සැපයීමසිදුනොකරනඅතර සියලුම වරායන්හි ඉන්ධන අලෙවිය ගිණුම්ගත කිරීමේදී ණය පදනම මත සිදු වුවා සේ සලකා ගිණුම්ගත කරනු ලබයි. මෝදරධිවරවාරයේනැංගුර ම්ලාතිබුයාත්‍රාවෙන්අයවිය යුතුරු.5,675,373කමුදලඅ යකරගැනීමසඳහාකොළඹ වාණිජඅධිකරණයේනඩු පවරාමේ වනවිටවිභාගවෙමින්පවතී. | ඉන්ධන ණයට සැපයීම අත්හිටුවීම හා විධිමත්ව අයකරගැනීමේ ක්‍රමවේදයක් මත ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) නව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කර කැබිනට් මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට කමිටුව උපදෙස් දී තිබුණද 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වාම බඳවාගැනීමේ පටිපාටි සකස්කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබූ අතර චක්‍රලේඛ වලට පටහැනිව වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් එකී වැරදි නිවැරදි කිරීමට ගෙන නොතිබුණි. | නවබඳවාගැනීමේපටිපාටිය සකස්කරඉදිරිපත්කිරීමෙන් අනතුරුව 2018 අප්‍රේල්මස 14 වනදිනඒසඳහාඅනුමැතිය ලැබීඇත.එහිපිටපතක්මේස මඟඉදිරිපත්කරමි. | චක්‍රලේඛ වලට පටහැනිව වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් එකී වැරදි නිවැරදි කිරීමටකටයුතු කල යුතුයි. |
| (ඊ) 2014 පෙබරවාරි 18 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පොදු කාරක සභාවේ 74 රැස්වීමේ උප කමිටු II ලබා දුන් තීරණය අනුව පෙර ගෙවුම් ලෙස ගෙවා තිබුණු රු. 36,659,356 ක මුදල වර්ෂ කිහිපයක සිටම අයකර නොතිබූ අතර ඒ පිළිබඳ කිසිඳු නීතිමය ක්‍රියාමාර්ගයන්ද ගෙන නොතිබුණි. | වසර 10 කටවඩාපැරණිශේෂයන්බැවින්ඒපිළිබඳසොයාබලාඑමශේෂයන්නිරවුල්කිරීමටඅවශ්‍යකටයුතුසිදුකිරීමසඳහාකමිටුවක්වෙතයොමුකරඇත. | වසර 10 කට වඩා පැරණි පෙර ගෙවුම් ශේෂ පිළිබඳ කළමනාකරණය නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |